# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

## ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION

ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය
2021.03.17

හිතවත් සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය/සහොදරිය,

**<u>අප නිළධාරීන්ගේ ගැටලු සම්බන්ධයෙන් වර්තමානයේ පවතින සැබෑ තත්වය හා සංගමයේ ඉදිරි ක්‍රියා මාර්ග.</u>**

අප සංගමයේ නිළධාරීන් ගරු අමාත්‍ය තුමන් හා අමාත්‍යාංශ ලේකම් තුමන් සමග 2021.02.16 දින සාකච්ඡාවක් පවත්වන ලදී.එහිදී අප විසින් ඉදිරිපත් කළ ගැටලු පහතින් සදහන් කරණු ලබන අතර ඒ සඳහා විසදුම් නොලැබීම හේතුවෙන් අතිගරු ජනාධිපති තුමන් සමග 2021.02.23 දින සාකච්ඡාවක් පැවැත්වීමට අප සංගමයට හැකි විය.එහිදී අප දෙපාර්තමේන්තුවට මෙන්ම සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වන ඔබ අප සියලු දෙනාට බලපාන්නාවූත් ඉතා කඩිනමින් විසදාගත යුතුම වූත් පහත සදහන් ගැටලු වලින් 1,2,3,4 යන කරුණු අතිගරු ජනාධිපති තුමන්ට ඉතා කඩිනමින් විසදුම් ලබා ගැනීමට මැදිහත්වන ලෙස ඉල්ලමින් අප සංගමයේ ගරු සභාපති තුමන් විසින් ඉදිරිපත් කරණ ලදී.එම කරුණු ඔබගේ දැනගැනීම පිණිස මෙසේ ඉදිරිපත් කරමි.

01.මේ වන විටත් සමස්ත සේවකයින් සඳහා සකස් කොට ඇති නව බඳවාගැනීම් හා උසස් වීමේ පරිපාටිය සහ දෙපාර්තමේන්තුවට අදාල සේවා සංයුතිය කඩිනමින් අනුමත කර ගැනීම.

02.නව සේවකයින් ලෙස දෙපාර්තමේන්තුවට අන්තර් ග්‍රහනය කරණලද නිළධාරීන්ට බලපාඇති වැටුප සම්බන්ධ ගැටලුවට විසදුම් ලබා ගැනීම.

03.පෙරදාතම් සේවකයින්ට ගෙවීමට සිදුවඇති 60% ක මුදලින් පොළිය අඩුකර දෙන ලෙස කරණලද ඉල්ලීමට ලබාදිය හැකි විසදුම් ලබා ගැනීම.

04.අප නිළධාරීන්ට අවුරුදු 23 ක් පුරාවට කිසිදු උසස් වීමක් නොමැති බැවින් හා මේ වනවිට කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතර මතුව ඇති වැටුප් විෂමතාවය අවමකරගැනීමට සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා MN – 3 වැටුප් කේතය අනුමතකර ගැනීම.

05.සියලුම ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා සමෘද්ධි බැංකුවෙන් රුපියල් 1500.00 – 3000.00 අතර මුදලක් මාසික දීමනාවක් ලෙස ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙනට ඉල්ලීම් සිදුකිරීම.

06.සමස්ත දි/ලේ කාර්යාල හා මූලස්ථාන වල සේවය කරණ සමෘද්ධි සංවර්ධන නිළධාරීට අතිකාල දීමනා ලබාදීම සඳහා බැංකු හා බැංකු සමිති වලින් වාර්ෂික ලාභයෙන් යම්කිසි ප්‍රතිශතයක් වෙන්කිරීමට අදාල බලධාරීන්ට උපදෙස් ලබාදෙන ලෙසට ඉල්ලීම් සිදු කිරීම.

07.2017 වර්ෂයේදී බදවාගන්නා ලද නිළධාරීන්ගේ EB එකේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු කඩිනමින් ස්තිර පත්වීම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.


| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
|---|---|---|
| එන්.ජී.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ජී.වී.බස්නායක |
| දු:අං: 017-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |

| උප සභාපති | උප ලේකම් | ජාතික සංවිධායක |
|---|---|---|
| ටී.ජී.දයාවංශ | බී.ඩී.ජී.වික්‍රමසිංහ | එච්.ජී.සරත් |
| දු:අං: 071-2585394 | දු:අං:076-5566136 | දු:අං:071-8105051 |

අංක , 68
දෙහිදෙනිය
පේරාදෙනිය


2021.03.17

මෙම කරුණු සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ ජනාධිපති තුමන් මෙම කරුණු අදාල අංශ වෙත ඉදිරිපත් කර විසඳුම් ඉතා කඩිනමින් ලබාදීමට කටයුතු කරණ බවට දැණුම් දුන් අතර නැවත මාස 03 කින් වෘත්තීය සමිති කැඳවා ප්‍රගතිසමාලෝචනයක් සිදුනරණ බවද දැනුම් දෙන ලදී.

මෙම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ගරු අගමැතිතුමන් විසින් ( කළමණාකරණ සේවා දෙපාර්තමේනතුව වැටුප් හා සේවක සංඛ්‍යා කමිෂන් සභාව,විශ්‍රාමවැටුප් දෙපාර්තමේන්තුව,මුදල් අමාත්‍යාංශය ) ආදී වූ මෙම ගැටලු වලට සම්බන්ධ සියලු ආයතන වල වගකිවයුතු නිළධාරීන් 2021.03.15 දින කැඳවා සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවේදී පහත සදහන් තීරණ වලට එළඹ ඇති බැව් ප්‍රකාශ කරමි.

01.මේ වන විටත් සමස්ත සේවකයින් සඳහා සකස් කොට ඇති නව බඳවාගැනීම් හා උසස් වීමේ පරිපාටිය සහ දෙපාර්තමේන්තුවට අදාල සේවා සංයුතිය කඩිනමින් අනුමත කර ගැනීම.

(මෙම ගැටලුව සඳහා ඉතා කඩිනමින් වැඩමුලුවක් පවත්වා මෙහි ඇති අඩුපාඩු සකස් කොට අනුමැතිය ලබාදීමට වැටුප් හා සේවක සංඛ්‍යා කමිෂන් සභාව එකගතාවය පලකර ඇත.)

02.නව සේවකයින් ලෙස දෙපාර්තමේන්තුවට අන්තර් ග්‍රහනය කරණලද නිළධාරීන්ට බලපාඇති වැටුප සම්බන්ධ ගැටලුවට විසදුම් ලබා ගැනීම.

(මෙම ගැටලුවට අප සංගමයේ ඉල්ලීම පරිදිම ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගතයුතු බව අදාල සියලු ආයතන ප්‍රකාශකර ඇති බැවින් එය සකස් කොට 2021.03.31 දිනට පෙර ඉදිරිපත් කරණ ලෙසට ගරු අග්‍රාමාත්‍ය තුමන් විසින් අප දෙපාර්කමේන්තුවට සහ අමාත්‍යාංශයට නියෝග කර ඇත.)

03.පෙරදාතම් සේවකයින්ට ගෙවීමට සිදුවඇති සේ:අ:අ: මුදලින් රජයේ භාගය සඳහා වන පොළිමුදල අඩුකර දෙන ලෙස කරණලද ඉල්ලීමට ලබාදිය හැකි විසදුම් ලබා ගැනීම.

(මෙම ඉල්ලීමට එකගවිය නොහැකි බවත් ගෙවියයුතු මුදල කොටස් වශයෙන් ගෙවා නිමකිරීම සඳහා මාස 120 ක කාලයක් ලබාදිය හැකිබවත් කළමණාකරණ සේවා දෙපාර්තමේනතුව හා විශ්‍රාමවැටුප් දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර ඇත.එහිදී ගරු අග්‍රාමාත්‍ය තුම මැදිහත්වී මෙහි ඇති නීතිමය තත්වය තවදුරටත් පරික්ෂාකර බලා සතියක් ඇතුලත වාර්තාවක් ලබාදෙන ලෙසට මුදල් අමාත්‍යාංශයට පවරා ඇත.)

04.අප නිළධාරීන්ට අවුරුදු 23 ක් පුරාවට කිසිදු උසස් වීමක් නොමැති බැවින් හා මේ වනවිට කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතර මතුව ඇති වැටුප් විෂමතාවය අවමකරගැනීමට සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා MN – 3 වැටුප් කේතය අනුමතකර ගැනීම.

(මෙම කාරණාව සම්බන්ධෙයන් ගැටලු සහගත තත්වයක් උද්ගතවන බව කළමණාකරණ සේවා දෙපාර්තමේනතුවත් වැටුප් හා සේවක සංඛ්‍යා කමිෂන් සභාවත් කරුණු ඉදිරිපත් කර ඇති අතර එම අවස්ථාවේදී ගරු අග්‍රාමාත්‍ය තුමන්ගේ

මැදිහ

ත්වීම මත MN – 2 වැටුප් කේතය අනුමත කිරීම සිදුකළහැකි බවත් ප්‍රකාශකර ඇත.එම නිසා ඒ කටයුත්ත කඩිනම් කිරීම සිදුකරණ ලෙසට දන්වන ලදී.එසේම මේවනවිට මෙම නිළධාරීන් හට අවුරුදු 20 ට වැඩි සේවාකාලයක් ඇති බැවින් ශ්‍රේණි උසස් වීම පලමුවන කාර්යක්ෂමතා කඩඉම් විභගය සමත් සියලු දෙනාට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභගය නොතියා ලබා දීමට කළමණාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ලබාදීමට එකගවී ඇත.)

05.සියලුම ක්ෂේත්‍ර නිළධාරීන් සදහා සමෘද්ධි බැංකුවෙන් රුපියල් 1500.00 – 3000.00 අතර මුදලක් මාසික දීමනාවක් ලෙස ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙනට ඉල්ලීම් සිදුකිරීම.

06.සමස්ත දි/ලේ කාර්යාල හා මුලස්ථාන වල සේවය කරණ සමෘද්ධි සංවර්ධන නිළධාරීට අතිකාල දීමනා ලබාදීම සඳහා බැංකු හා බැංකු සමිති වලින් වාර්ෂික ලාභයෙන් යම්කිසි ප්‍රතිශතයක් වෙන්කිරීමට අදාල බලධාරීන්ට උපදෙස් ලබාදෙන ලෙසට ඉල්ලීම් සිදු කිරීම.

07.2017 වර්ෂයේදී බඳවාගන්නා ලද නිළධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභගයේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු කඩිනමින් ස්ථිර පත්වීම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

(ඉහත සඳහන් කරුණු අතරින් 5,6,7 යන සියලුම ඉල්ලීම් අපගේ අධ්‍යක්ෂ ජනරාල් තුමන් සමග සාකච්ඡාකරගෙන විසදාගන්නා ලෙසට දැනුම්දෙන ලදී.ඒ අනුව අධ්‍යාක්ෂ ජනරාල් තුමන් 5,6 යන කරුණු බැංකු කළමණාකරණ කමිටුවට ඉදිරිපත් කර ඉටුකර දීමටත් 7වන කරුණ ඉතා කඩිනමින් සිදුකිරීමටත් එකගතාවය පලකර ඇත.

ඉහත සඳහන් ආකාරයට අපගේ මූලික ගැටලු වලට සාධනීය පිළිතුරු ලබාගතහැකි වූයේ අපසංගමයේ මැදිහත්වීම මත බව සහෝදර නිළධාරී ඔබ සියලු දෙනාට මෙයින් දන්වා සිටින අතර මෙම කරුණු මේ ආකාරයට ඉටුනොවුන හොත් ඉතා කඩිනමින් වෘත්තීය ක්‍රියාමාර්ග වලට අවතීරණය වන බවත් ඒ සඳහා ඔබසියලු දෙනාගේ දායකත්වය ලබාදෙන ලෙසත් මෙයින් ඉල්ලා සිටිමි.

**සටනකින් තොර වෘත්තීය ජයග්‍රහන නොමැත ඒ සඳහා පෙළ ගැසෙන්න අප හා එක්වන්න සියලු දෙනාට ජය.**

ප්‍රධාන සහාපති
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

ප්‍රධාන ලේකම්
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051